# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත






**මේ යුගයේ ප්‍රබලතම ඛේදවාචකය වන්නේ නපුරු මිනිසුන්ගේ නපුරු ක්‍රියා නොව හොඳ මිනිසුන්ගේ නිහඬතාවයි - - මාටින් ලූතර් කිං**

# ලියා දන්වන වගයි

## කුඩු රජවරු

දකුණු ආසියාවේ විශාලතම හෙරොයින් තොගය පසුගියදා අල්ලා ගත්තේ ශ්‍රී ලංකාවට එවන ලද ග්‍රීස් ටින් තොගයක් තිබූ කන්ටේනරයකිනි. මේ කුඩු කන්ටේනරය රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලිපියක් රේගුවට ලැබෙයි. මේ ලිපිය ලියනු ලැබ ඇත්තේ තමාගේ ලේකම්වරයකු විසින් යයිද තමා ඒ ගැන හාංකවිසියක්වත් දන්නේ නැතැයිද කියමින් දැන් අගමැතිවරයා රට වටේ යයි. මහජනතාව හැටියට අපට ඇත්තේ මෙවැනි ප්‍රශ්න කීපයකි.

තමාගේ ලේකම්වරයා විසින් ලියන ලද ලිපියට අගමැතිවරයාට වගකීමක් නැද්ද?

අගමැති කාර්යාලයෙන් කුඩු කන්ටේනරය නිදහස්කරන්නැයි ඉල්ලා ලිපියක් රේගුවට ලැබී ඇති බැවින් කුඩු කන්ටේනරය සම්බන්ධයෙන් අගමැතිවරයා හා ලේකම්වරයා අත්අඩංගුවට නොගන්නේ ඇයි?

අගමැතිවරයා මේ පරීක්ෂණයට සහය දක්වනුවස් ඉල්ලා අස් නොවන්නේ ඇයි?

මේ සියල්ල දෙස ජනාධිපතිවරයා අන්ධව බලා සිටින්නේ ඇයි?

මේ භයානක තත්වය හමුවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරු අගමැතිවරයාට චරිත සහතික දෙන්නේත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරු ඇල් මැරුණ විරෝධතාවක නිරව සිටින්නේත් මන්දැයි අපට නම් නොවැටහේ. පෙරටුගාමීන්ද මර නින්දේ ය.

රටකට කුඩු ගෙන්වන්නේ ඒ රටේ මැති ඇමතිවරුන් නම් ඒ වග රටේ නායකයාද දන්නේ නම් නීතිය ඒ දෙස ඇස් වසා බලා සිටින්නේ නම් ඒ රටට යන කල දසාව කුමක්ද?

මහජනතාවගේ ඇස් රවටන සංවර්ධනයට මුවා වී රටක අධ්‍යාත්මය විනාශ කරමින් සිටින ආකාරය බලා සිටින්නට සිදුවීම කෙතරම් නම් අභාග්‍යයක්ද?

## තවත් අවුරුද්දක්

තවත් නව වසරක් එළැඹ තිබේ. දැන් ඇත්තේ සම්ප්‍රදායික ලෙස සැමටම සුබ නව වසරක් පැතීමේ අවස්ථාවයි. එකිනෙකාට සුබ පතා ගනිමින් සිත් සනසා ගැනීමෙන් පමණක් සෑහීමකට පත්වන්නට හැකිද?

අද ඇත්තේ නව යුගයක් වෙනුවෙන් ජනතාව පෙළ ගැස්සීමේ වගකීමක් නොවේද? අසල්වැසි ඉන්දියාවේ දූෂණ විරෝධී නව දේශපාලන පක්ෂයක් බිහිවී ඒ පක්ෂය පාලක කොන්ග්‍රස් පක්ෂය පරදවා දිල්ලි ප්‍රාන්ත මැතිවරණයෙන් ජය ලබා රජයක් පිහිටුවීමේ ආශ්වාදණීය ප්‍රවෘත්තියෙන් යමක් උකහා ගනිමින් මේ වසරේ අපට ගමන් ඇරඹිය නොහැකිද? අද ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇත්තේ අර්වින්ද් කෙජ්රිවාල් කෙනෙක් නොවේද? අපේ අර්වින්ද් කෙජ්රිවාල් සොයා ගත හැකි වන්නේ කොතැනින්ද? එවන් නායකත්වයක් බිහිවන තෙක් අපි කුමක් කළ යුතුද? එවන් දේශපාලන ව්‍යාපාරයක් ගොඩනගා ගන්නට අප කළ යුතුවන්නේ කුමක්ද? නව වසරේ අපේ කල්පනාක්ෂිය යොමුවිය යුත්තේ ඒ දෙසට බව අපට සිතෙයි

සංස්කාරක

# ඉන්දියාවේ "පරිවර්තන්"

## නව වසරේ ශ්‍රී ලංකාවට අවශ්‍ය පරිවර්තනය




ගාමිණී වියන්ගොඩ

ඔහුගේ නම අර්වින්ද් කෙජ්රිවාල් ය. ඔහු දේශපාලඥයෙකු නොව, සමාජ ක්‍රියාකාරිකයෙකි. ඔහු ආරම්භ කළ සමාජ ව්‍යාපාරය "පරිවර්තන්" ය. පසුගිය දා ඔහු ඉන්දියාව කුල්මත් කෙළේය. විශාල වෙනස්කම්වල

**_දූෂණයට එරෙහිව පිහිටුවා ගත්, වසර දෙකක්වත් පැරණි නොවූ "ආම් ආද්මි පක්ෂය" පසුගිය දා, ඉන්දියාවේ පාලක දේශපාලන පක්ෂය වන කොන්ග්‍රස් පක්ෂය සහ වසර 15 ක් තිස්සේ එහි බලය හෙබැවූ එම පක්ෂයේ මහ ඇමතිවරියව පරාජයට පත්කරමින් දිල්ලි ව්‍යවස්ථාදායක සභාවේ පාලන බලය දිනාගත්තේය_**

ආරම්භය, පුංචි වෙනස්කම් යැයි ඔහු තරයේ විශ්වාස කරයි. ඔහු දුන් ආදර්ශය, වෙනසක් අපේක්ෂා කරන ජනතාවට ආශ්වාදයකි. මග පෙන්වීමකි.

තොරතුරු දැන ගැනීමේ අයිතියී පිළිබඳ ලෝකයා පිළිගත් නීතියක් ගෙන ඒමට ඉඩ නොදෙන පාලකයන් සිටින ලංකාව වැනි රටක ජනතාව, අරවින්ද් කෙජ්රිවාල් ගැන විශේෂයෙන් දැනගත යුතුය. මීට කලකට පෙර " තොරතුරු දැන ගැනීමේ අයිතිය" නීතියක් වශයෙන් සම්මත කරන මෙන් ඉල්ලා සිටි උද්ඝෝෂණය පසුපස එක්තරා විදිහක "විදග්ධ" ගතියක් හෙවත් සාමාන්‍ය ජනතාවට නොතේරෙනි ගතියක් පෙනෙන්ට තිබිණැ යි ඇතැම්හු කීහ. එහෙත් එම අයිතිය දීම ලංකාවේ පාලකයන් එක දිගටම ප්‍රතික්ෂේප කරන්නේ ඇයි දැ යි ජනතාවට තේරුම් කර දීම අපහසු කටයුත්තක් නොවන්නේය.

යම් පුද්ගලයෙකු හෝ පවුලක් හෝ කණ්ඩායමක් බලයට කෑදර වන්නේ, හුදෙක් බලය සඳහා පමණක්ම නොවේ. හුදු බලයම, විටෙක යම් පුද්ගලාස්ව-


4 වන පිටට